# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 17 දරන
## ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 17 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 09 වන දින.]

එල්.ඩී.-ඕ. 5/98.

**1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1998 අංක 17 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1998 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**1991 අංක 52 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයෙහි "මුදල් කටයුතු කර ගෙන යන" යන වචන වෙනුවට, "මුදල් කටයුතු කර ගෙන යන ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) විදුලි සංදේශ සේවා සලසන ව්‍යාපාරය කර ගෙන යන.".

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—D 047343— 6,925 (98/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.